# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 12 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි

# 1990 අංක 12 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 63/89

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1990 අංක 12 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

433අ අළුත් වගන්තිය 1979 අංක 15 දරන පනතෙහි ඇතුළත් කිරීම.

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ පනතේ 433අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"කුලී සින්නක් කර ශිවිසුමක විෂයය වස්තුව වන්නා වූ දේපලක සන්තකය.

433අ. (1) කුලී සින්නක්කර හෝ බදු දීමේ හෝ ගිවිසුමක් යටතේ කුලියට දෙන ලද වාහනයක් සම්බන්ධයෙන් වූ විට, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ එම වාහනයේ පරම අයිතිකරු ලෙස ලියාපදිංචිව සිටින තැනැත්තා, මේ පරිච්ඡේදයේ කාර්යයන් සඳහා එම වාහනයේ සන්තකය දැරීමට හිමිකම ඇති තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කිසියම් වාහනයක් පරම අයිතිකරු ලෙස, එක් තැනැත්තකුට වැඩි ගණනක් ලියාපදිංචිව සිටින අවස්ථාවක, ඒ වාහනය සම්බන්ධයෙන්, එම කාලසීමාවේ පළමුවෙන් ම ලියාපදිංචිව සිටින තැනැත්තා මේ පරිච්ඡේදයේ කාර්යයන් සඳහා එම වාහනයේ සන්තකය දැරීමට හිමිකම ඇති තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.